02. මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටෙන්ඩර් පතක් ම රු. 2,000 ක මුදලක් ගෙවා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් සමග ඉදිරිපත් කළ යුතු ය.

03. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය සමග ඔවුන්ට අයත් නිශ්චල දේපළවල වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය මහලේකම් තැනගෙන් ලබාගෙන ඇමිණිය යුතු ය. එය තැබෑරුමට ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදලේ වටිනාකමෙන් සියයට පහළොවකට (15%) නොඅඩු සහතිකයක් විය යුතු ය. මෙම ඡේදයේ සඳහන්වන සහතිකයට අදාළ නිශ්චල දේපළ මෙකී රේන්ද කාලය තුළ දී විකිණීමට හෝ පැවරීමට තහනම් වන්නේ ය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවා සේ සැලකේ.

04. සෑම ටෙන්ඩර් පතක් ම සීල් තබන ලද කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ ''2021 වර්ෂය සඳහා අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කර 2020 අගෝස්තු මස 28 වැනි දින පෙරවරු 10.30 ට පෙර අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම් ඒවා ලියාපදිංචි තැපෑලෙන් ඉහත සඳහන් පරිදි එවිය යුතු ය. 2020.08.28 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩරය විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් අදාල දින නියමිත වේලාවට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පතු මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල මුදලින් ගෙවිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් තැන්පත් කිරීම පැහැර හැරියහොත් හෝ ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වූ බව ප්‍රකාශ කරනවාත් හැර එය පැහැර හරින්නාගේ නම සියලු සුරාබදු බලපත්‍රවලට අදාළ පැහැර හරින්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු සියලුම ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලු ම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :-

| අනු. අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රදේශය හා කොටස | තැබෑරුම විවෘත කරන වේලාව |
|---|---|---|---|
| 01 | අනුරාධපුර | අනුරාධපුර නගරයේ නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා<br>ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා |

09. තනි බලයලත් පුද්ගලයා විසින් එහි අට (08) වැනි ඡේදයේ සඳහන් ප්‍රාදේශීය ලේකම් විසින් වෙන් කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස් කළ යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් යෝජිත ස්ථානයක් සපයාගත යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනත් ස්ථානයක විවෘත නොකළ යුතු අතර, එසේ කිරීමට ගතයුතු අනුමැතිය බලය ලැබීමේ අනුමැතිය ආරම්භ වීමට දින 14 කට පෙර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත යුතු ය.

10. රා තැබෑරුම පවත්වාගෙන යන ගොඩනැගිල්ල කිසියම් රජයේ ආයතනයකට, සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට අයත් වන විට රේන්දයට අදාළ සම්පූර්ණ කාලයට එම ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ ආයතනයට බද්ද ගෙවා ඒ බැව් ගිවිසුමේ අත්සන් කිරීමට පෙර සනාථ කළ යුතු ය.

11. මේ සම්බන්ධයෙන් විස්තර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ය.

12. *වැදගත්* .- 2020.08.28 වැනි දින රා රේන්ද විකිණීමට නොහැකි වුවහොත් 2020.09.16 වැනි දින පෙරවරු 10.30 ට නැවත විකුණනු ලැබේ.

ඊ. එම්. ආර්. පී. බී. ඒකනායක,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
නැගෙනහිර නුවරගම් පළාත,<br>
අනුරාධපුර.

2020 ජූලි මස 13 වැනි දින.

08-31

---

## කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

### 2021 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2021 ජනවාරි මස 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුනු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද, දැනට බල පවත්නා සියලුම සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් ව 2020.09.25 වැනි දින පෙ.ව. 10.30 දක්වා ම විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද ලබාගැනීමට ඉදිරිපත් වන අය, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා, ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද (අදාළ ටෙන්ඩරයේ සඳහන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක්) සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන ''තැබෑරුමේ අංකය හා නම ද'' පැහැදිලිව ලියා, ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, කටාන ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන 2020.09.25 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කටාන ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2020.11.26 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන් ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින, එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00ට පෙර කටාන ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන වාරික දෙකක රේන්ද මුදල් කොටසට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

කේ. ජී. එච්. එච්. ආර්. කිරිඇල්ල,
ප්‍රාදේශීය ලේකම්,
කටාන.

2020 ජූලි මස 20 වැනි දින,
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනුක්‍රමික අංකය | තැබෑරුමේ නම සහ අංකය | කොට්ඨාසය | තැබෑරුම් පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය | තැබෑරුම් විවෘත කරන වේලාව | තැබෑරුම් වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 01. | මූකලන්ගමුව අංක 13 | කටාන | මූකලන්ගමුව ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 4,000.00 | 2020.09.25<br>පෙ.ව. 10.30 |
| 02. | කටුනායක අංක 14 | කටාන | කටුනායක ගමේ පමණක් | පෙ. ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 4,000.00 | 2020.09.25<br>පෙ.ව. 10.30 |
| 03. | ඇත්ගාල අංක 13 | කටාන | ඇත්ගාල ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 500.00 | 2020.09.25<br>පෙ.ව. 10.30 |
| 04. | නෑ/කටාන අංක 24 | කටාන | නෑ/කටාන ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2,000.00 | 2020.09.25<br>පෙ.ව. 10.30 |
| 05. | දෙමන්හන්දිය අංක 27 | කටාන | දෙමන්හන්දිය ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2,000.00 | 2020.09.25<br>පෙ.ව. 10.30 |
| 06. | බම්බුකුලිය අංක 26 | කටාන | බම්බුකුලිය ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 1,000.00 | 2020.09.25<br>පෙ.ව. 10.30 |

08-97

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ**

2021 වර්ෂය සඳහා රා රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුම්වල 2021 ජනවාරි මස 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු ය. යම්කිසි තැබෑරුමක් සඳහා එක් අයෙක් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතු ය. හවුලේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා උපරිම වශයෙන් පස් දෙනෙක් ඇතුළත් විය හැකි ය.

03. ටෙන්ඩරය විවෘත කරන දිනට වයස අවුරුදු 21 සම්පූර්ණ වූ පිරිමි ශ්‍රී ලංකා පුරවැසියන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වන අතර, වගකීම් පැහැරහැරි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියේ හෝ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධව වගකීම් පැහැරහැරි අයගේ නාමාවලියේ හෝ වෙනත් හේතූන් නිසා කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් පිළිබඳ වන කිසිම කටයුත්තකට මැදිහත් වීම තහනම් කරනු ලැබූ අයගේ නාම ලේඛනයේ නම සඳහන් වූ අය මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි. තව ද, සුරාබදු බලපත්‍ර දැරීම යටතේ සුරාබදු බලපත්‍රධාරීන් යටතේ රක්ෂාවේ නියුක්ත වීම තහනම් කොට ඇති අයගේ නාමාවලියේ නම සඳහන් වූ හෝ අපරාධ වැලැක්වීමේ ආඥාපනතින් අදහස් කරන ආකාරයේ අපරාධකරුවෙක් වූ හෝ සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ කවර විටක දී වුවත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන්වරකට වඩා වැඩි වාරයක් වරදකරු කරන ලද හෝ මෙම වරප්‍රසාදය ආරම්භ වීමට කලින් වූ දෙවසර ඇතුළත සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

04. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ ටෙන්ඩර් තැන්පත් මුදල ලෙස නියම කරන ලද රුපියල් පන්දහසක් (රු. 5,000/-) තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ය. ටෙන්ඩර්කරු ඉදිරිපත් කරන නිශ්චල දේපළ පිහිටා තිබෙන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහළවකට (15%) නොඅඩු විය යුතු ය. එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු 05ක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

තව ද, වත්කම් සහතිකයේ මුල් පිටපත දිසාපතිවරයෙකු/ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් රඳවාගෙන ඇති අවස්ථාවක දී එම නිලධාරියා විසින් ම සහතික කරන ලද පිටපතක් පිළිගත හැකි අතර, ටෙන්ඩරය ආවරණය වන පරිදි එහි වත්කම් පැවතිය යුතු ය. එක දිස්ත්‍රික්කයක තිබෙන තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට යම් ටෙන්ඩර්කරුවෙකු විසින් කටයුතු කරන විටදී පළමුවෙන් ම ඉදිරිපත් කරන ටෙන්ඩරය සඳහා වත්කම් සහතිකයේ මුල් පිටපත ඇමිණිය යුතු අතර, ඉන්පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් සඳහා වත්කම් සහතිකය ඇමුණූ ටෙන්ඩරයේ විස්තර ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු ය. (මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීමේ රගැසට් නිවේදනයේ පස්වන (5) ඡේදයේ කරුණු අදාළ වේ.)

05. සීල් තබන ලද කවරයක බහාලූ එක් එක් ටෙන්ඩර්පත ඇතුළත් කවරයේ උඩ වම් පස කෙළවරේ "අංක ........................... දරන රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය - කොළඹ" යනුවෙන් සඳහන් කර

(අ) කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, හෝ

(ආ) ලියාපදිංචි තැපැලෙන් කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් රා තැබෑරුම් සඳහා බලපවත්වනු ලබන කොන්දේසි යටතේ දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී කාර්යාලයට පැමිණ සිටිය යුතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේ ම ගැනුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු ය.

07. මිලයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර, ටෙන්ඩර්කරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින්, විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් මුදල් ආපසු දීම සහ ඉහත සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ආපසු ගෙවනු ලැබේ.

08. 2020 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේ දැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැළකිය යුතු ය.

09. ලැබී ඇති සියලුම ටෙන්ඩර්පත්‍රයන් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීමට හෝ ලැබී ඇති සියලුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

10. මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී අංක 207 හා 1982 අගෝස්තු මස 20 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද තොටුපල් රේන්ද විකිණීම යටතේ වූ රා රේන්ද විකිණීමේ කොන්දේසි අදාළ කරගත යුතු ය.

අනුමත කරන ලද කොන්දේසි හා ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාගවෙමින් පවතින එෆ්. ආර්. 383/2015 දරන මූලික අයිතිවාසිකම් නඩුවට අදාළ ව නියම කර ඇති කොන්දේසි අනුව අදාළ කර ගත යුතු රා රේන්ද සීමා මායිම් සහිත රා තැබෑරුම් ලැයිස්තුව පහත උපලේඛනයේ දැක්වේ :

උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා බල පවත්වනු ලබන පොදු කොන්දේසි -

* තැබෑරුම විවෘත කරන වේලාව පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා හා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා
* තැබෑරුම වසන වේලාව ප. ව. 2.00 සිට ප. ව. 5.00 දක්වා වේ.
* ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 5,000 කි.
* ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2020.09.14 වැනි දින පෙ. ව. 10.30 වේ.
* රා තැබෑරුම් විකුණන දිනය 2020.09.14 වැනි දින පෙ. ව. 10.45 වේ.

එම්. ජේ. එස්. කාංචනා ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ 12.

2020 ජූලි මස 23 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) |
|---|---|---|
| 01. | අංක 01 කොට්ඨාසය කොටහේන බටහිර (කොටබෝම්) | *උතුරට* : ස්කිනර් පාරේ දකුණු පෙදෙස සන්දියේ සිට කොටබෝම් වීදියේ සන්ධියට සහ ලැස්කිරන් වීදියේ සන්දිය දක්වාත් ය. |
| | | *නැගෙනහිරට* : ලැස්කිරන් වීදියේ සිට බටහිර පැත්ත ස්කිනර් පාරේ (දකුණු) සන්ධියේ සිට පෙදෙස හා ජම්පටා වීදිය |

| *(ඒ)* අනුක්‍රමික අංකය | *(බී)* ප්‍රදේශය | *(සී)* ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) |
|---|---|---|
| | | *දකුණට :* එහි සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස කොටබෝම් වීදිය සහ ලැස්කිරන් වීදියේ සන්ධිය දක්වා පෙදෙස සහ<br><br>*බටහිරට :* එකී සන්ධියේ සිට කොටබෝම් වීදියේ නැගෙනහිර පෙදෙස ජම්පටා වීදියේ සන්ධියේ සිට ස්කිනර් පාර (උතුරට) සන්ධිය දක්වා වූ පෙදෙසත් ය. |
| 02. | අංක 02 කොට්ඨාසය කොටහේන (ස්කිනර් පාර) | එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ උතුරු පෙදෙස පිකරින් පාරේ සහ කොටහේන වීදියේ සන්ධිය දක්වා වූ පෙදෙස |
| 03. | අංක 03 කොට්ඨාසය මෝදර | (ඒ) ඉහළ වීදියේ ප්‍රදේශය ඇන්ඩෘ පෙදෙසේ සන්ධිය දක්වා අලුත් මාවත පාර සහ ශාන්ත ඇන්ඩෘ පාරේ සන්ධිය දක්වා,<br>(බී) ශාන්ත ඇන්ඩෘ පාර පෙදෙසේ සන්ධිය දක්වා ඉහළ ශාන්ත ඇන්ඩෘ පෙදෙසේ සහ මාෂන් වීදියේ සන්ධිය දක්වා,<br>(සී) මෝදර වීදියේ ප්‍රදේශ සහ එහි සන්ධිය දක්වා, මාෂන් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා,<br>(ඩී) ශාන්ත ජේම්ස් වීදියේ දෙපස එහි සන්ධි දක්වා මෝදර වීදියේ සහ අලුත් මාවත පාරේ සන්ධිය දක්වා,<br>(ඊ) අලුත් මාවත පාරේ දෙපස සහ එහි සන්ධිය දක්වා, එහි පටුමග සහ පහළ ශාන්ත ඇන්ඩෘ පෙදෙසේ සන්ධිය දක්වාත් ය. |
| 04. | අංක 04 කොට්ඨාසය මාදම්පිටිය (ෆර්ගියුෂන් පාර) | *උතුරට :* පර්ගියුෂන් පාර, දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ ගඟ දක්වා<br>*නැගෙනහිරට :* ලූකස් පාරේ බටහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා<br>*දකුණට :* මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා, ලූකස් පාරේ සන්ධිය දක්වා<br>*බටහිරට :* දානියෙල් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා මාදම්පිටිය පාරේ සහ හීන මුල්ල පටුමගේ සන්ධිය දක්වාත් ය. |
| 05. | අංක 05 කොට්ඨාසය මාදම්පිටිය | *උතුරට :* පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා, ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා,<br>*නැගෙනහිරට :* නාගලගම් වීදියේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා, ෆර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා,<br>*දකුණට :* මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා, නාගලගම් වීදියේ සහ ලූකස් පාරේ සන්ධිය දක්වා,<br><br>*බටහිරට :* ලූකස් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ ෆර්ගියුෂන් පාරේ සන්ධිය දක්වාත් ය. |

11. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

12. *වැදගත් .-* 2020.09.14 වැනි දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද 2020.11.05 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

08-114/1

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංගොඩ, කොටිකාවත්ත, අංක 397/09 දරන ස්ථානයෙහි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 552422481V හිමි කුරුප්පු ආරච්චිගේ ආනන්ද ලාල් වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මංජුලා නිශාන්ති රූපසිංහ මහත්මිය වර්ෂ 2018ක් වූ නොවැම්බර් මස 04 වැනි දින ලියා සහතික කරන ලද අංක 1754 දරන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව බත්තරමුල්ල කලාප කාර්යාලයේ ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 256 බාණ්ඩයේ 14 පත්ඉරුවෙහි 20113 දිනපොත් අංකය යටතේ වර්ෂ 2018 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් අංගොඩ, කොටිකාවත්ත, අංක 397/09 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 926720384 V හිමි ගදාා පවිත්‍රිකා කුරුප්පු යන අය වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙම දැන්වීමේ දින සිට බල පැවැත්වෙන පරිදි මින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලංකාවාසී සියලු දෙනා හට මින් දැනුම් දෙමි.

කුරුප්පු ආරච්චිගේ ආනන්ද ලාල්.

08-26

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අලවතුගොඩ, අක්කර 40, අංක 497 (පෙරදි අංක 363 ගාලු පාර, ගල්කිස්ස) දරන ස්ථානයේ පදිංචි රන්කොත් ගෙදර රූපවති (ජා. හැ. අංක 507821979 V) වන මා විසින් අලවතුගොඩ, අක්කර 40 හි පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ ශ්‍රියාකාන්තිට (ජා. හැ. අංක 635233591 V) ප්‍රදනය කරන්නට යෙදුනු වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින අලවතුගොඩ දී අත්සන් තබන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. අමිල ඩී. අඹගල මහතාගේ අංක 1064 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් එහි සඳහන් කාරනා සහ ක්‍රියාවන් කිරීම සඳහා දී තිබූ බලය අද දින සිට හෙවත් වර්ෂ 2020 ක් වූ ජූනි මස 18 වැනි දින සිට ප්‍රත්‍යාදිෂ්ඨ කොට, ශූන්‍ය කොට අවලංගු කළ බවත්, මින් මතු එකී වීරසිංහ මුදියන්සේලාගේ ශ්‍රියාකාන්ති යන අය විසින් මාගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සියලු ලක්වැසියන්ටත් මෙයින් දැනුම් දෙමි.

රන්කොත් ගෙදර රූපවති.

08-84

## දැන්වීමයි

2007 අක 7 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2010 ජූලි 13 වැනිදා සිට බලපැවැත්වෙන පරිදි සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : ඩිමෝ ලයිෆ්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00224261
ලියාපදිංචි ලිපිනය : නො. 65, ජේතවන පාර, කොළඹ 14

ජේසී ඇන්ඩ් කම්පැනි,
කම්පැනි සෙක්‍රටරීස්.

නො. 9/5, තඹිබයියා ඇවනියු,
කොළඹ 07.

08-104

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමගාමේ නම : එස්. ඒ. එස්. ක්‍රියේටිව් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00212741
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : වී 4, වෙළඳ සංකීර්ණය, මත්තේගොඩ
ලියාපදිංචි දිනය : 2019.06.18

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

08-115

---

## ඩ්‍රෙස්මෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය පීවී 102542

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ සංඩිය ඇවරකරුවන්ගේ පත්වීමේ දැන්වීම

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ඩ්‍රෙස්මෝ (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අසෝකාරාම පාර, කුන්දෙනිය, දික්වැල්ල |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය, (කොළඹ සිවිල්) |
| නඩු අංකය | : | HC (CIVIL) 74/2019 CO |
| සංඩිය ඇවරකරුවන්ගේ නම් | : | පිංචබදුගේ එක්සිරි අරුණ ජයවික්‍රම සහ ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් |
| ලිපිනය | : | සංඩිය ඇවරකරුවෝ 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04 |
| පත්වීමේ දිනය | : | 2020 ජනවාරි 29 |

08-131/1

## ඩ්‍රෙස්මෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PV 102542

2007 අංක 07 දරන සමාගම් පනතේ XII යටතේ පරිවෘත කිරීමේ නියෝගය

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ඩ්‍රෙස්මෝ (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අසෝකාරාම පාර, කුන්දෙනිය, දික්වැල්ල |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය, (කොළඹ සිවිල්) |
| නඩු අංකය | : | HC (CIVIL) 74/2019 CO |
| නියෝගය දුන් දිනය | : | 2020 ජනවාරි 29 |
| පෙත්සම ඉදිරිපත් කළ දිනය | : | 2019 සැප්තැම්බර් 25 |
| සංධිය ඈවරකරුවන්ගේ නම් | : | පිංචබඳුගේ එක්සිරි අරුණ ජයවික්‍රම සහ ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් සංධිය ඈවරකරුවෝ |
| ලිපිනය | : | 3 වන මහල, අංක 11 කාසල් පටුමග, කොළඹ 04. |

08-131/2

---

## සීතාවක ප්‍රොපටි මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

(සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යටත්)

සමාගමේ ලියාපදිංචි අංකය PV 2537

අවසන් මහා සභා රැස්වීම සහ සමාගම විසුරුවා හැරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 331 (2) වගන්තිය යටතේ සෑහීමකට පත්වීමෙන් අනතුරුව ගණන් බේරා වසා දැමීමට යටත් සමාගමේ ගිණුම් සහ අනෙකුත් දේ සම්බන්ධයෙන් පවත්වන අවසන් මහ සභා රැස්වීම 2020 සැප්තැම්බර් මස 15 වැනි දින පස්වරු 4.00 ට කොළඹ 04, කාසල් පටුමගේ අංක 11, 3 වන මහලෙහි පිහිටි රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගම ඈවරකිරීමේ කටයුතු සිදුකල ආකාරය,
2. සමාගමේ වත්කම් උපලබ්ධි කල ආකාරය සහ
3. අදාල අනෙකුත් විස්තර ලබාදීම සම්බන්ධයෙන්

ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ්,
ඈවරකරු.

සීතාවක ප්‍රොපටි මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
3 වන මහල, අංක 11, කාසල් පටුමග,
කොළඹ 04.

2020 ජූලි මස 22 වැනි දින.

08-132

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මහජනයා වෙත කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ නම : චන්ඩිස් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක : PV 00223718
සංස්ථාගත කරන ලද දිනය : වර්ෂ 2020 ජූලි මස 04 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 76/බී, දොඩන්වලපිටිය, පේරාදෙණිය.

සමාගම් ලේකම්.

2020 ජූලි මස 24 වැනි දින.

08-136

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : නිව්ලෝන්ග් ඉන්ඩස්ට්‍රියල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංක : PV 00224149
සංස්ථාගත කරන ලද දිනය : වර්ෂ 2020 ජූලි මස 12 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 52, නාගහතැන්න, හිරියලගම්මන, වැරැල්ලගම.

සමාගම් ලේකම්.

2020 ජූලි මස 24 වැනි දින.

08-137

---

## දැන්වීමයි

පහත සඳහන් සමාගම ලියාපදිංචි කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : එම්. ඩී. බී. හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 00221976
ලියාපදිංචි කාර්යාලය : අංක 272/5, වෙරළුගොඩවත්ත, ඇඹිල්මීගම, පිළිමතලාව

ඉහත කී සමාගම වෙනුවෙන්

ආරච්චිගේ සමන්ත මංජුල.

අංක 272/5, වෙරළුගොඩවත්ත,
ඇඹිල්මීගම, පිළිමතලාව.

08-140

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුගාමීව පහත සඳහන් සීමිත වගකීම් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : එනර්ජි ඉවොල්වඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 119868
සංස්ථාගත කළ දිනය : 2017.02.03
ලියාපදිංචි කාර්යාලය : අංක 320/6, ගාලු පාර, කොළඹ 03.

සමාගම් අධ්‍යක්ෂ.

08-141

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුගාමීව පහත සඳහන් සීමිත වගකීම් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : වන් ටෙක් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 115478
සංස්ථාගත කළ දිනය : 2016.08.02
ලියාපදිංචි කාර්යාලය : අංක 3- 1/1, කින්රෝස් ඇවනිව්, කොළඹ 04.

සමාගමේ අධ්‍යක්ෂ.

08-142

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : අර්ට්සි ගැලරියා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 00224211,
ලියාපදිංචි කාර්යාලය : 390 ඊ, පැරණි කොට්ටාව පාර, උඩහමුල්ල, නුගේගොඩ.
තැපැල් කේතය : 10250

අධ්‍යක්ෂක මණ්ඩලය.

2020 ජූලි මස 20 වැනි දින.

08-161

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

වැලිවිට, කඩුවෙල අංක 139 සහ දැනට කොළඹ 04, ලොරිස් පාර, අංක 50 හි පදිංචි දොන් ඔස්වල්ඩ් කැමිලස් විලත්ගමුව වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මින් දැනුම් දෙන වගහැටි නම්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත බලධාරි සහ ඇටෝර්නි බලපත්‍ර පොතේ 200 කාණ්ඩයේ 49 පත් ඉරුවේ අංක 5396 දරන දින පොත් අංකය යටතේ 1999.07.09 දින ලියාපදිංචි කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. කේ. එස්. සුරේශ් චන්ද්‍ර මහතා විසින් 1998.05.13 දින ලියා සහතික කරන ලද අංක 2205 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මා විසින් කොළඹ 04, ලොරිස් පාර, අංක 50 හි පදිංචි නානායක්කාර මාහාබරනගේ දොන් චන්ද්‍රසේන යන අය මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද එකී අංක 2205 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවටත්, මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත්,

තවද, ඉහත කී නානායක්කාර මාහාබරනගේ දොන් චන්ද්‍රසේන විසින් අද පටන් මා වෙනුවෙන් කරනු ලබන සියලු ක්‍රියාවන් වෙනුවෙන් මම වගකීමට යටත් නොවන බවට ද මෙයින් දන්වා සිටිනු ලැබේ.

සරත් වල්ගමගේ.

08-164

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාකොළ, මාකොළ දකුණ, අංක 232/1/3 දරන ස්ථානයේ පදිංචි පැස්කුවල් හැන්දි සුනිල් ශාන්ත මෙන්ඩිස් (ජා. හැ. අංක 663421948 V) වන මා විසින් ගාල්ල, හිරඹුර හරස් පාර, අංක 38/2G දරන ස්ථානයේ ස්ථිර පදිංචි හා දැනට කෑගල්ල, නුවර පාර, මීපිටිය, අංක 731 ඇලූරෝමා එන්ටර්ප්‍රයිසස් හි පදිංචි අම්බන පල්ලිය ගුරුගේ විජයසිරි (ජා. හැ. අංක 643561239 V) යන අයට, ප්‍රසිද්ධ නොතාරිස් රංජිත් වංශනාථ සේනාධීර මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1240 සහ 2014.10.20 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රයෙන් එහි සඳහන් කාරණා සහ ක්‍රියාවන් මා වෙනුවෙන් ඉටු කිරීම සඳහා දී තිබූ බලය වර්ෂ 2020 ක් වූ ජූලි මස 23 වැනි දින සිට ශුන්‍ය හා බල රහිත කොට අවලංගු කරන බව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සියලු ලක් වැසියන්ටත් මෙයින් දැනුම් දෙමි.

පැස්කුවල් හැන්දි සුනිල් ශාන්ත මෙන්ඩිස්.

08-165

## ඇටර්නි බලපත්‍රය අවලංගු කළ බවට දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වරල්ල පැලවත්ත හේන්යාය අංක 117 දරන ස්ථානයේ පදිංචි මහන්තෙ ආරච්චිගේ අනුර වන මම ශ්‍රී ලංකාවාසී ජනතාවටත්, එකී ජනරජයටත් මෙයින් දැනුම් දෙන්නේ මාගේ ඇටර්නි බලකාරිය වශයෙන් මාලඹේ මිහිඳු මාවතේ අංක 566/7 දරන ස්ථානයේ පදිංචි අංක 535364532 V දරන ජාතික හැඳුනුම්පත හිමි කොළොඹගේ දෝන චිත්‍රානි නමැති අයව පත්කළ ප්‍රසිද්ධ නොතාරිස් ගල්හේනගේ රණබාහු පෙරේරා ලියා සහතික කළ අංක 778 සහ 2019.09.30 දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය 2020.08.07 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කළ බවය.

08-292

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් චන්දන ගුණරත්න මහතා විසින් 2020 ජූලි මස 28 වැනි දින ලියා සහතික කළ අංක 880 දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාර සීදුව මූකලන්ගමුවල මීගමුව පාර අංක 531/2 හි පදිංචි විදේශ ගමන් බලපත්‍ර අංක 2428321 දරන අනුක ගසාර සහ විදේශ ගමන් බලපත්‍ර අංක 093110566 දරන දොන් චන්ද්‍රසෝම ගසාර (කොළඹ කාගෝ එක්ස් ප්‍රෙස් ලිමිටඩ් පී බී 7453 හි අධ්‍යක්ෂවරුන් වන අප විසින් කිරුළපන මස්ජිද් පාර අංක II දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අංක 581681801 දරන මිනේරි ගමගේ දොන් සමරක්කොඩි පෙරේරා යන අයට ලබා දී තිබූ ඇටෝර්නි බලපත්‍රය මින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, එකී ලේඛනය මෙතැන් පටන් බලපැවැත්මක් නොවන බවත් 2020 ජූලි මස 31 වැනි දින සිට එකී මිනේරි ගමගේ දොන් සමරක්කොඩි පෙරේරා විසින් කරන ලද කිසිදු ක්‍රියාවක වගකීම අප විසින් භාර නොගනිමි.

අනුක ගසාර සහ දොන් චන්ද්‍රසෝම ගසාර.

2020 ජූලි 31 වැනි දින.

08-294

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් චන්දන ගුණරත්න මහතා විසින් 2020 ජූලි මස 28 වැනි දින ලියා සහතික කළ අංක 881 දරන ඇටෝනි බලපත්‍රය ප්‍රකාර සීදුව මූකලන්ගමුවල මීගමුව පාර අංක 531/2 හි පදිංචි විදේශ ගමන් බලපත්‍ර අංක 2428321 දරන අනුක ගසාර සහ විදේශ ගමන් බලපත්‍ර අංක 093110566 දරන දොන් චන්ද්‍රසෝම ගසාර (කොළඹ කාගෝ එක්ස් ප්‍රෙස් ලිමිටඩ් පී වී 7453 හි අධ්‍යක්ෂවරුන් වන අප විසින් කිරුළපන මස්ජිද් පාර අංක II දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අංක 581681801 දරන මිනේරි ගමගේ දොන් සමරක්කොඩි පෙරේරා යන අයට ලබා දී තිබූ ඇටෝර්නි බලපත්‍රය මින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, එකී ලේඛනය මෙතැන් පටන් බලපැවැත්මක් නොවන බවත් 2020 ජූලි මස 31 වැනි දින සිට එකී මිනේරි ගමගේ දොන් සමරක්කොඩි පෙරේරා විසින් කරන ලද කිසිදු ක්‍රියාවක වගකීම අප විසින් භාර නොගනිමි.

අනුක ගසාර සහ දොන් චන්ද්‍රසෝම ගසාර.

2020 ජූලි 31 වැනි දින.

08-295

---

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

ඕස්ට්‍රේලියාවේ, වික්ටෝරියා 3173 කෙයාබ්‍රො, ග්ලෙන් ෆ්‍රෙන් ස්ට්‍රීට්, 22 දරන ස්ථානයේ පදිංචි චාමර මහේෂ් කහද ගමගේ (ශ්‍රී ලංකාවේ අංක 51, මහවීදිය, ගාල්ල ලිපිනයේ සහ ජාතික හැඳුනුම්පත් අංක 823222190 V හිමි) වන මම ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. මනම්පේරි විසින් සහතික කරන ලද අංක 3042 සහ 2004 අගෝස්තු මස 02 දින දරන ගාල්ල, දකුණු කලාප කාර්යාලය, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දිනපොත් අංක 386 යටතේ 4 වෙළුමේ 46 වන පත්තිරුවේ ලියාපදිංචි කර ඇති ඇටර්නි බලපත්‍රය මගින් ගාල්ල, ප්‍රධාන වීදිය, අංක 51 දරන ස්ථානයේ පදිංචි ලක්ෂ්මි සේරසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 194656802353) යන අයට දෙන ලද ඇටර්නි බලය වර්ෂ 2020 අගෝස්තු මස 07 වැනි දින අවලංගු කර නිෂ්ප්‍රභා කර බල රහිත කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ. 2020 අගෝස්තු මස 07 වැනි දිනෙන් පසුව ඉහත කී ඇටර්නි බලය යටතේ එකී ලක්ෂ්මි සේරසිංහ විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මම වග නොකියනු බවද දැනුම් දෙමි.

චාමර මහේෂ් කහද ගමගේ.

2020 අගෝස්තු මස 07 වැනි දින දී ය.

08-306

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

අංක 195/12/1, දෙනියවත්ත පාර, වීර මාවත, දෙපානම පන්නිපිටිය යන ලිපිනයේ පදිංචි ගයාත්‍රී මධූෂා සමරතුංග (හැඳුනුම්පත් අංකය : 865680023 V) යන මා විසින් ගම්මුදලිඳුගේ විමල් ප්‍රියන්ත සමරතුංග යන අය වෙත බලය පවරා ඇති අංක 21284 දරන ඇටර්නි බලපත්‍ර ලේඛනයේ 296 වෙළුමේ 144 පිටුවේ ලියාපදිංචි කර ඇති ඇටර්නි බලපත්‍රය 2019 දෙසැම්බර් මස 17 වැනි දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇති බවත්, මින් මතු ඉහත සඳහන් ඇටර්නි බලපත්‍රය උපයෝගී කරගෙන සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වගනොකියන බවත් දන්වා සිටිමි.

ගයාත්‍රී මධූෂා සමරතුංග.

08-308

**විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

රාජගිරිය, මැද වැලිකඩ පාරේ, අංක 63/4 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 942480202 V හිමි නාකලන්දගේ ඩිශාන් උදීශ අල්විස් වන මා විසින් රාජගිරිය, මැද වැලිකඩ පාරේ, අංක 63/4 දරන ස්ථානයේ පදිංචි දුමින්ද්‍රා සජීවනී රත්නායක යන අය වෙත ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් වේරගොඩ ලියනගේ ගයනි නදීෂා පෙරේරා මහත්මිය විසින් 2019.01.21 වැනි දින ලියා සහතික කරන ලද අංක 23 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය වර්ෂ 2020 ජූලි මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨකොට අවලංගු කරන බවත්, එකී දුමින්ද්‍රා සජීවනී රත්නායක යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් තවදුරටත් ක්‍රියා නොකරන බවත් මෙතැන් පටන් ඇය විසින් එළඹෙන කවර හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ආණ්ඩුවටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

නාකලන්දගේ ඩිශාන් උදීශ අල්විස්.

2020 ජූලි මස 23 වැනි දින.

08-166

---

# රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත්

**හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2021 වර්ෂය

2021 ජනවාරි මස 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ විදේශ මත්පැන් (ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකට ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත් ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් විදේශ මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙන් දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් (15%) වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක.............................. දරන.................................... විදේශ මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කර 2020.08.27 වැනි දින පෙ.ව. 10.30 ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. 2021 වර්ෂය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන විදේශ මත්පැන් තැබෑරුම් කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2020.08.27 වැනි දින පෙ.ව. 10.30ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයට පෙනී සිටිය හැකිය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වන විදේශ මත්පැන් තැබෑරුම් නැවත විකිණීම 2020.09.24 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* අවශ්‍යතාවයන්ට අනුකූලව විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය. (දුරකථන අංක : 032- 2222138 - 2223205).

බී. ඩබ්. එම්. එම්. එස්. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්.
හලාවත.

2020 ජූලි මස 21 වැනි දින,
හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාර ගන්නා දිනය හා වේලාව* | *ටෙන්ඩර් භාර ගන්නා දෙවන දිනය හා වේලාව* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|---|
| හලාවත | අංක 07 කොටස පිටිපන වීදිය, හලාවත | 2020.08.27 පෙ.ව. 10.30 | 2020.09.24 පෙ.ව. 10.30 | පෙ.ව. 11.00 සිට ප.ව.2.00 දක්වා ප. ව. 05.00 සිට ප. ව. 08.00 | 1,500.00 |
| හලාවත | අංක 06 කොටස පිටිපන වීදිය, හලාවත | එම | එම | එම | 1,500.00 |

08-79

---

**අඹගමුව කෝරළයේ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2021 වර්ෂය**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට යටත්ව 2021 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරයට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා අඹගමුව ප්‍රාදේශීය ලේකම් විසින් 2020.09.18 වැනි දින පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

*(ආ)* ඇප මුදලක් ද වශයෙන් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදලක් ද තැන්පත් කර ලබාගන්නා නිල කුවිතාන්සිය; සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ අතිරේක ආණ්ඩුවේ ඒජන්තගෙන්/ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික කිරීම පිළිබඳ යථෝක්ත විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි සැලකිලිමත් විය යුතු ය :

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි පහත සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්වල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් ම/කපා හැරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙකු ම ටෙන්ඩර් පෝරම සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි වූ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා, සීල් තබා, කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංක හා නම සඳහන් කර, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ ශීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවේ ටෙන්ඩර්කරුවන් අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන්, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක්, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය. මෙම මුදල ප්‍රාදේශීය ලේකම් නමින් ගිනිගත්හේන මහජන බැංකුවේ වර්ෂයක ස්ථිර තැන්පත් ගිණුමක රඳවා ගැනීමට එකඟ විය යුතු ය. මෙම තැන්පතු මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් ''ආරක්ෂිත චෙක්පත්'' ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට හා කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවළුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් ඒවා 2020.11.10 වැනි දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

11. ටෙන්ඩ විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ යුතුය.

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2020 ජුනි මස 24 වැනි දින,
ගිනිගත්හේන අඹගමුව කෝරළයේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

*විදේශ මත්පැන් තැබෑරුම් :*

| *අංකය* | *තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| 01. | නෝර්වුඩ් | නෝර්වුඩ් නගර බල ප්‍රදේශය අංක 03 තුළ | 2020.09.18 පෙ. ව. 10.30 | රු. 5,000 |
| 02. | දික්ඔය | හැටන් දික්ඔය නගර සභා සීමාවේ කොට්ඨාස අංක 04 තුළ | 2020.09.18 පෙ. ව. 10.30 | රු. 5,000 |
| 03. | දික්ඔය | හැටන් දික්ඔය නගර සභා සීමාවේ කොට්ඨාස අංක 05 තුළ | 2020.09.18 පෙ. ව. 10.30 | රු. 5,000 |

08-29

---

## උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - වර්ෂ 2021

1982 වර්ෂයේ අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපානු ලබන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2021 වර්ෂය තුළ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන වන, මා විසින් 2020.08.21 වැනි දින පෙ. ව. 10.30 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයකින් සමන්විත විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක්, සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිළිබඳ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු යః-

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් හා,
*(ආ)* වත්කම් සහතිකයක් සමග

ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ තැබෑරුම් අංකය සහ නම සඳහන් කර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කර "වරප්‍රසාදය මිල දී ගත් තැනැත්තා"යැයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30ට පෙර උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුව විසින් ''ගෙවීම් සඳහා'' ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ විය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද 2020.09.29 වැනි දින පෙරවරු 10.30ට නැවත විකිණීම සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. වැඩි විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත- ගම්පොල.

2020 ජූලි මස 01 වැනි දින,
ගම්පොල- උඩපළාත
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*2021 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව*

| *අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත.* |
|---|---|---|---|---|---|
| 01. පුස්සැල්ලාව විදේශ මත්පැන් තැබෑරුම | උඩපළාත | පුස්සැල්ලාව නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2020.08.21 වැනි දින පෙ. ව. 10.30 | 3,000.00 |

08-28/2

## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ

### 2021 වර්ෂය සඳහා රටබීම තැබෑරුම් රේන්ද විකිණීම

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක් එක් ප්‍රාදේශික ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2021 ජනවාරි මස 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

* 1982 අගෝස්තු මස 20 වැනි දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි,
* සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. සෑම ටෙන්ඩර්පත්‍රයක් ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු ය. යම්කිසි තැබෑරුමක් සඳහා එක් අයෙක් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය. හවුලේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා උපරිම වශයෙන් පස් දෙනෙක් ඇතුළත් විය හැකි ය.

03. ටෙන්ඩරය විවෘත කරන දිනට වයස අවුරුදු 21 සම්පූර්ණ වූ පිරිමි ශ්‍රී ලංකා පුරවැසියන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වන අතර, වගකීම් පැහැර හැරි කොන්ත්‍රාත් නාමාවලියේ හෝ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධව වගකීම් පැහැර හැරි අයගේ නාමාවලියේ හෝ වෙනත් හේතූන් නිසා කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් පිළිබඳ වන කිසිම කටයුත්තකට මැදිහත් වීම තහනම් කරනු ලැබූ අයගේ නාම ලේඛනයේ නම සඳහන් වූ අය මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි. තව ද, සුරාබදු බලපත්‍ර දැරීම යටතේ සුරාබදු බලපත්‍රධාරීන් යටතේ රක්ෂාවේ නියුක්ත වීම තහනම් කොට ඇති අයගේ නාමාවලියේ නම සඳහන් වූ හෝ අපරාධ වැලැක්වීමේ ආඥාපනතින් අදහස් කරන ආකාරයේ අපරාධකරුවෙක් වූ හෝ සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ කවර විටක දී වුවත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන්වරකට වඩා වැඩි වාරයක් වරදකරු කරන ලද හෝ මෙම වරප්‍රසාදය ආරම්භ වීමට කලින් වූ වසර ඇතුළත සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

04. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ ටෙන්ඩර් තැන්පත් මුදල ලෙස නියම කරන ලද රුපියල් පන්දහසක් (රු. 5,000) තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ය. ටෙන්ඩර්කරු ඉදිරිපත් කරන නිශ්චල දේපළ පිහිටා තිබෙන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහළොවකට (15%) නොඅඩු විය යුතුය. එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු 05ක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

තව ද, වත්කම් සහතිකයේ මුල්පිටපත දිසාපතිවරයකු/ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් රඳවාගෙන ඇති අවස්ථාවක දී එම නිලධාරියා විසින් ම සහතික කරන ලද පිටපතක් පිළිගත හැකි අතර ටෙන්ඩරය ආවරණය වන පරිදි එහි වත්කම් පැවතිය යුතු ය. එක දිස්ත්‍රික්කයක තිබෙන තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට යම් ටෙන්ඩර්කරුවකු විසින් කටයුතු කරන විටදී පළමුවෙන් ම ඉදිරිපත් කරන ටෙන්ඩරය සඳහා වත්කම් සහතිකයේ මුල් පිටපත ඇමිණිය යුතු අතර ඉන්පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් සඳහා වත්කම් සහතිකය ඇමුණූ ටෙන්ඩරයේ විස්තර ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු ය. (මේ සම්බන්ධව කටයුතු කිරීමේදී රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ ගැසට් නිවේදනයේ පස්වන (5) ඡේදයේ කරුණු අදාළ වේ.)

05. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර්පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ "2021 වර්ෂයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ............................ දරන රට බීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය"යි යන්න සඳහන් ටෙන්ඩර්පත්‍ර 2020.09.17 වැනි දින පෙ. ව. 10.30 ට පෙර ලැබෙන සේ කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු යි.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේ ම ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රට බීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතුය.

07. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කල්හි තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලංසුකරු විසින් හෝ සම්පූර්ණ මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

08. ලැබී ඇති සියලුම ටෙන්ඩර් පත්‍රයන් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීමට හෝ ලැබී ඇති සියලුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

09. 2020 වර්ෂය සඳහා දැනට විදේශීය මත්පැන් රේන්දය පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

10. මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී අංක 207 හා 1982 අගෝස්තු මස 20 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරන ලද තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම යටතේ වූ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි අදාළ කරගත යුතු ය.

අනුමත කරන ලද කොන්දේසි හා රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත උපලේඛනයේ දැක්වේ.

උපලේඛනයේ සඳහන් රටබීම තැබෑරුම් සඳහා බල පවත්වනු ලබන පොදු කොන්දේසි :-

* තැබෑරුම විවෘත කරන වේලාව පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා හා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා වේ.
* තැබෑරුම වසන වේලාව ප. ව. 2.00 සිට ප. ව. 5.00 දක්වා වේ.
* ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 5,000 කි.
* ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2020.09.17 වැනි දින පෙ. ව. 10.30 වේ.
* රට බීම තැබෑරුම් රේන්ද විකුණන දිනය 2020.09.17 වැනි දින පෙ. ව. 10.45 වේ.

**උපලේඛනය**

| *(ඒ)* | *(බී)* | *(සී)* |
|---|---|---|
| *අනුක්‍රමික අංකය* | *ප්‍රදේශය* | *ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* |
| 01. | අංක 01 කොට්ඨාසය කොටුව | *උතුරට :* ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට යොර්ක් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට යොර්ක් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට පල්ලිය වීදියේ මධ්‍ය රේඛාව හා ලේඩන් බැස්ටියන් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලේඩන් බැස්ටියන් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගිය විට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට නැගෙනහිර දිශාවට ගිය විට එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව හා කෙළින් වීදියේ මධ්‍ය රේඛාව හමුවන බාන් ඔරලෝසු කණුව පිහිටි සන්දියේ මධ්‍ය ලක්ෂ්‍යයේ සිට එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද,<br><br>*නැගෙනහිරට :* එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව හා දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද, |

*දකුණට* : දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හා ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට යොර්ක් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට යොර්ක් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද,

*බටහිරට* : ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද වේ.

02. අංක 02 කොටියාසය- මෝදර

*උතුරට* : පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හා ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට ඩිලාසල් වීදියේ මධ්‍ය රේඛාව හා මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හමුවන කෝවිල සන්දියේ පිහිටි මධ්‍ය ලක්ෂ්‍යයේ සිට මෝදර වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට විස්ට්වයික් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද,

*නැගෙනහිරට* : මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා විස්ට්වයික් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට මෝදර පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට අළුත්මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන රාස්සමුණ කන්ද හතරමන් හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂය දක්වා ද,

*දකුණ* : මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන රාස්සමුණ කන්ද හතරමන් හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,

*බටහිරට* : අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හා පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගිය විට ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද වේ.

11. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

12. ***වැදගත්*** .- 2020.09.17 වැනි දින විකිණීමට නොහැකි වූ රට බීම මත්පැන් තැබෑරුම් රේන්ද 2020.11.06 වැනි දින පෙ.ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

එම්. ඒ. එස්. කාන්චනා ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2020 ජූලි මස 23 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-114/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## පොලිස් නිල සුනඛ කොට්ඨාසය

පොලිස් නිල සුනඛයින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් සේවයෙන් ඉවත් කළ නිල සුනඛයින් 25 දෙනෙකු 2020.08.15 වැනි දින පැය 09.00 ට මහනුවර අස්ගිරිය, පොලිස් නිල සුනඛ මූලස්ථානයේ දී වෙන්දේසි කරනු ලැබේ. මෙම නිල සුනඛයින් එදින උදේ පැය 0800 ට පරීක්ෂා කර බැලිය හැකි බව දන්වා සිටිමි.

| අනු. අංකය | වර්ගය | පිරිමි | ගැහැණු | එකතුව |
|---|---|---|---|---|
| 01. | බෙල්ජියම් මැලිනෝයිස් | 05 | 07 | 12 |
| 02. | ජර්මන් ෂෙපර්ඩ් | - | 01 | 01 |
| 03. | ඉංග්ලිෂ් ස්පැනියල් | 01 | - | 01 |
| 04. | රොට්වයලර් | 02 | 01 | 03 |
| 05. | ලැබ්‍රෝඩර් රිට්රිවර් | 02 | 02 | 04 |
| 06. | ඩැල්මේෂන් | - | 02 | 02 |
| 07. | රිජ්බැක් | 01 | - | 01 |
| 08. | ටෙරියර් | 01 | - | 01 |
| **එකතුව** | | **12** | **13** | **25** |

ඩී. ඒ. ඒ. බී. දෙල්ගහපිටිය,
සහකාර පොලිස් අධිකාරී.

2020 ජූලි මස 22 වැනි දින,
පොලිස් නිල සුනඛ කොට්ඨාසය,
අස්ගිරිය, මහනුවර.

08-103

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ජී. ඒ. පී. කේ. රණසිංහ.
ගිණුම් අංක : 0095 5000 2040 .

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2016.04.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි පහළොස් ලක්ෂ හැත්තෑ දෙදහස් හාරසිය අසූ දෙකයි ශත දහ තුනක (රු. 11,572,482.13) මුදල ද, 2016 මාර්තු මස 11 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි හත් ලක්ෂ අසූ දහසක (රු. 10,780,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්න සිදු වූ වෙනත් ගාස්තු ද තදනන්තරව දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2016.09.15 දින රජයේ ගැසට් පත්‍රයේ 2016.09.13 දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.09.03 වැනි දින පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ලියාපදිංචි කොට්ඨාසය තුළ හාපිටිගම් කෝරළේ උඩුගහ පත්තුවේ මීරිගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිරිඋල්ලගම අංක 1 A ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගිරිඋල්ල ග්‍රාමයේ පිහිටි කෝන්ගහලන්ද නොහොත් රේන්දපොල්වත්ත නොහොත් කොන්නගහවත්ත යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන අයි. කොටඹගේ යන අය විසින් සාදන ලද 2010 ජූලි 03 දතම හා අංක 188/2010 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන ජේ. පී. අයි. අබේකෝන් යන අය විසින් සාදන ලද 1994 අප්‍රේල් මස 08 දතම හා අංක 1066 දරන පිඹුරේ ලොට් 1 සහ පාර (මාර්ග සංවර්ධන අධිකාරිය) නැගෙනහිරට : පාර (මාර්ග සංවර්ධන අධිකාරිය) දකුණට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ ඉඩම සහ එච්. සී. ද මෙල් යන අයගේ ඉඩම සහ බස්නාහිරට : අංක 1066 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසි එකයි දශම තුනයි බිංදුවක් (අ. 0 රූ.2 , පර්. 21.30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්. ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 188/2010 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව H 51/105 යටතේ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-155

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එච්. එල්. ඒ. මදුශංක.
ගිණුම් අංක : 1029 5709 8940.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.11.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අසූ හතර ලක්ෂ තිස් දෙදහස් එකසිය දහ හතයි ශත දහසයක (රු. 8,432,117.16) මුදලද, 2019 ඔක්තෝබර් 30 දින සිට අංක 2678 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ අට ලක්ෂ පනස් අට දහස් එකසිය හතළිස් දෙකයි ශත තිස් දෙකක (රු. 7,858,142.32) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.02.21 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.02.12 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.08.26 වැනි දින පෙ.ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්වරන් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මාදම්පේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ, ගලහිටියාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කරුක්කුව ග්‍රාමයේ පිහිටි "කරුක්කුව වලව්ව එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. ඒ. ෆොන්සේකා යන අය විසින් සාදන ලද 2012 ජූලි 07 දාතම හා අංක 0084E දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාර (බලයලත් මානක තැන ඒ. ජී. එස්. බී. පරාක්‍රම විසින් සාදන ලද 239 B දරන පිඹුරේ ලොට් 108), නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර (බලයලත් මානක තැන ඒ. ජී. එස්. බී. පරාක්‍රම විසින් සාදන ලද 239 B දරන පිඹුරේ ලොට් 108), දකුණට : බලයලත් මානක තැන ඒ. ජී. එස්. බී. පරාක්‍රම විසින් සාදන ලද 239 B දරන පිඹුරේ ලොට් 4 සහ 5 සහ බස්නාහිරට : බලයලත් මානක තැන ඒ. ජී. එස්. බී. පරාක්‍රම විසින් සාදන ලද 239 B දරන පිඹුරේ ලොට් 10 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම එකක් (A:0, R:0, P:20.1) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක 0084E දරන පිඹුරට අනුවය.

එකී ලොට් 0084E දරන පිඹුරේ නිරූපිත ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කරුක්කුව ග්‍රාමයේ පිහිටි "කරුක්කුව වලව්ව එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. සී. එස්. බී. පරාක්‍රම යන අය විසින් සාදන ලද 1992 ජුනි 01 දාතම හා අංක 239 B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 9 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 108, නැගෙනහිරට : ලොට් 108, දකුණට : ලොට් 4 සහ 5 සහ බස්නාහිරට : ලොට් 10 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම එකක් (A:0, R:0, P:20.1) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක 239 B දරන එකී පිඹුරට අනුව වෙළුම/ පත්ඉරුව F 85/109 යටතේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 239 B දරන පිඹුරේ නිරූපිත ලොට් 108 දිගේ ඒ මතින් උඩින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒ හා බැඳුන වෙනත් අයිතීන් ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-157

---

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

ගම්පහ දිසා අධිකරණයේ දී ය

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත, කොළඹ 01, බියගම, මල්වාන, අංක 536/30 දරන ස්ථානයේ, ''බියගම ශාඛාව'' යනුවෙන් සඳහන් කර හා හඳුන්වනු ලබන, ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාර ස්ථානයක් ඇත්තේ ය.

නඩු අංකය : 440/MB
ස්වභාවය : උකස්
මුදල : රු. 1,669,974.93
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

.......................පැමිණිලිකරු.

විරුද්ධව

දිසානායක මුදියන්සේලාගේ සිරිවර්ධන
අංක 231/2, කඳුබොඩ, දෙල්ගොඩ.

.....................විත්තිකරු.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2018 ක්වූ සැප්තැම්බර් මස 21 වැනි දින මෙම

නඩුවේ ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුලත් කර ඇත.

(අ) රු. 1,195,771.41ක් සහ රු. 474,203.52ක් ලෙස සමස්ථය රු. 1,669,974.93 ක මුදලක් සහ රු. 1,195,771.41 ක් වූ එකී මුදල මත 2016 දෙසැම්බර් මස 01 වන දින සිට ඒ මුදල අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් වර්ෂයකට 13.5% ක වැඩිදුර පොලියක් ද සමග අයකර ගැනීම සඳහා විත්තිකරුට විරුද්ධව නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2018ක් වූ සැප්තැම්බර් මස 21 වැනි දින ගම්පහ දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේදී වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 09 වැනි දින ප. ව. 3.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**ඉහත සඳහන් පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කඳුබොඩ ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, උතුරින් අංක 8335 දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ලෙන් හා අංක 1886 දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් අංක 67/2005 දරන පිඹුරේ 2. ඉ බිම් කැබැල්ලෙන් (අඩි 10ක් පළල ඇති පාර) දකුණින් අංක 67/2005 පිඹුරේ 2 සී හා 2 ඉ බිම් කැබැලිවලින් සහ බස්නාහිරින් විතානගේ ජයතුංගට අයත් බී බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු පී. එම්. ලීගාරත්න විසින් සාදන ලද අංක 206/206 හා 2006 ජූලි මස 16 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දහසයකින් (අ. 0 රූ. 0 පර්. 16) නොහොත් (හෙක්ටයාර් 0.0405) කින් යුක්තවූ ද, කැකුණගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 260/2006 දරන පිඹුරේ නිරූපිත ''ඒ'' බිම් කැබැල්ල ලෙස සළකුණු කොට ඇති බෙද වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

(අ) එකී ඉඩම් කැබැල්ලට අංක 260/2006 දරන එකී පිඹුරේ නිරූපිත පාරක් සඳහා වෙන් කරන ලද (අඩි 10 ක් පළල ඇති) ඉඩම මතුපිටින් හා ඒ ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

(ආ) බලයලත් මිනින්දෝරු ඒ. එම්. ඇස්. අත්තනායක විසින් සාදන ලද අංක 1886 හා 2001 දෙසැම්බර් මස 04 වැනි දින දරන පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 3 දරන ඉඩම සහ බලයලත් මිනින්දෝරු පී. එම්. ලීලාරත්න විසින් සාදන ලද අංක 67/2005 හා 2005 පෙබරවාරි මස 28 වැනි දින දරන පිඹුරේ 2 ඉ බිම් කැබැල්ල මතුපිටින් හා ඒ ඔස්සේ මාර්ග අයිතිය සහ වෙනත් සමාන අයිතිවාසිකම් ද සමග වේ.

ඉහත සඳහන් දෙවන උපලේඛනය

ඉහත පළමුවන උපලේඛනයේ විස්තර කර ඇති අංක 260/2006 දරන එකී පිඹුරේ නිරූපිත ''ඒ'' බිම් කැබැල්ල වශයෙන් සළකුණු කොට ඇති ඉඩම් කැබැල්ල, මෙහි පහත වඩාත් සවිස්තරව විස්තර කරනු ලබන ඉඩම් දෙකේ ඒකාබද්ධ කිරීමක් වේ.

1. ඉහත කී කඳුබොඩ ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, උතුරින් අංක 1886 දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ලෙන් හා අංක 8235 දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් 2 ඉ. බිම් කැබැල්ලෙන් දකුණින් 2 ඉ බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් අංක 8235 දරන පිඹුරේ 2 ඩී හා අංක 1 බිම් කැබැලිවලින් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු පී. එම්. ලීලාරත්න විසින් සාදන ලද අංක 67/2005 හා 2005 පෙබරවාරි මස 28 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දහසයකින් (අ. 0 රූ. 0 පර්. 10) යුක්ත වූ ද, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 623/229 වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, කැකුණගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එකී අංක 67/2005 දරන පිඹුරේ නිරූපිත 2 බී බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද බෙද වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

2. ඉහත කී කඳුබොඩ ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, උතුරින් අංක 82335 දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් 2 බී, හා 2 ඉ බිම් කැබලි වලින්, දකුණින් 2 සී බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් විතානගේ ජයමාන්නට අයත් 2 බී ඉඩමෙන් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු පී. එම්. ලීලාරත්න විසින් ලියා සහතික කරන ලද අංක 67/2005 හා 2005 පෙබරවාරි මස 28 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් හයකින් (අ. 0 රූ. 0 පර්. 6) යුක්ත වූ ද, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 623/231 වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, කැකුණගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එකී අංක 67/2005 දරන පිඹුරේ නිරූපිත 2 ඩී බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද බෙද වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිලි, වැවිලි, ගහකොළ හා වෙනත් සියලු දේද සමග වේ.

*ඉඩමට පිවිසීම.* -

බියගම EPZ හංදියේ සිට සියඹලාපේ හංදිය දක්වා කිලෝමීටර් 1.3ක් පමණ ගමන් කර වැලිවේරිය පාරට දකුණට හැරී කිලෝමීටර් 3.6ක් පමණ ගමන් කර (මීටර් 100ක් පමණ සිට දෙල්ගොඩ හංදිය පසුකර සහ ප්‍රාදේශීය සභා පරිශ්‍රයට අල්ලාපු) අලුබෝවිල පාරට දකුණු අත පැත්තට හැරී මීටර් 750ක් පමණ ගමන් කර අඩි 10ක් පළල කොන්ක්‍රීට් පාරට දකුණට හැරී ඒ පාරේ ඒ පාර අවසාන දක්වා මීටර් 40ක් පමණ ගමන් කිරීමෙන් දේපළ වෙත ළඟා විය හැක. අදාල දේපළ දකුණු අත පැත්තේ ඒ පාරට අභිමුඛව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරුවන් විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%), (2) නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තුව රු. 10,500, (3) සියළුම ප්‍රචාරක වියදම්, (4) වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු සියයට දෙකයි

දශම පහයි (2.5%), (5) රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු, (6) ලිපිකරු බෙරකරු හා සෝෂක ගාස්තුව රු. 4,500, (7) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහ (75%) මුදල දින 30ක් ඇතුලත දී ගම්පහ දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු ය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වන මහල,
මරදාන පාර,
කොළඹ 10.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු හා
උසාවි කොමසාරිස්.

වාණිජ මහාධිකරණය සහ කොළඹ
දිසා අධිකරණයේ සහ ගාල්ල දිසා අධිකරණයේ
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය හා වාණිජ බැංකු
අංක 200, 2 වන මහල, හල්ෆ්ඩ්‍රොප් වීදිය, කොළඹ 12.
දුරකථන අංක 011- 2445393/011-2396520
ඊමේල් : senaservice84@gmail.com

දුරකථන අංක 011- 2672262
011- 2672263
ෆැක්ස් අංකය : 2683073.

08-50

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | |
|---|---|---|
| | *රු.* | *ශ.* |
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2020 වර්ෂය** | | | |
| **අගෝස්තු** | 2020.08.07 | සිකුරාදා | 2020.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.08.14 | සිකුරාදා | 2020.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.08.21 | සිකුරාදා | 2020.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.08.28 | සිකුරාදා | 2020.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2020.09.04 | සිකුරාදා | 2020.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.09.11 | සිකුරාදා | 2020.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.09.18 | සිකුරාදා | 2020.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.09.25 | සිකුරාදා | 2020.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2020.10.02 | සිකුරාදා | 2020.09.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.10.09 | සිකුරාදා | 2020.09.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.10.16 | සිකුරාදා | 2020.10.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.10.23 | සිකුරාදා | 2020.10.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.10.29 | සිකුරාදා | 2020.10.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.